සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2020 ජූලි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate & Personal Taxation)

2020-10-04
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද මාධ්‍යයෙන්,* ***එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

## 01 වන ප්‍රශ්නය

**තෝමස්** ඕස්ට්‍රේලියානු පුරවැසියෙකි. ශ්‍රී ලංකාවේ සිටින විදේශික සේවාදායකයන්ට ආයෝජන උපදේශන සේවා සැපයීම සඳහා, 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන යටතේ සමාගමක් සංස්ථාපනය කිරීම සඳහා ඔහු 2018 මැයි 01 දින ශ්‍රී ලංකාවට පැමිණියේය. 2018/19 තක්සේරු වර්ෂය තුළදී ඔහුගේ ගමන් විස්තර පහත දැක්වේ:

| ශ්‍රී ලංකාවට පැමිණි දිනය | ශ්‍රී ලංකාවෙන් බැහැර වූ දිනය |
|---|---|
| 2018.05.01 | 2018.08.15 |
| 2018.11.15 | 2019.01.20 |
| 2019.03.05 | 2019.03.31 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව, 2018/19 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ආදායම් බදු අරමුණු සඳහා **තෝමස්ගේ** වාසික තත්ත්වය **පැහැදිලි කරන්න.**

(ලකුණු 05)

## 02 වන ප්‍රශ්නය

එකතුකල අගය මත බද්ද [Value Added Tax (VAT)], ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වක්‍ර බද්ද වේ. බදු අයකල හැකි සැපයුමක් සිදුකරන ලියාපදිංචි පුද්ගලයෙක් විසින් ඔහු විසින් සිදුකරන එම සැපයුම ලබාගන්නා පුද්ගලයා, VAT සඳහා ලියාපදිංචි පුද්ගලයෙක් නම්, බදු ඉන්වොයිසියක් නිකුත් කල යුතුය.

**ඔබ විසින් කල යුතු දෑ:**

(a) එකතුකල අගය මත බදු පනතේ විධිවිධාන අනුව, බදු ඉන්වොයිසියක ඇතුලත් කල යුතු කරුණු තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(b) 2019 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා VAT වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සොයිසා,** ඔහුගේ නිවසේ ගිණුම්කරණ ආයතනයක් පවත්වාගෙන යන අතර එහි ගිණුම්කරණ, විගණන, සහ බදු උපදේශන සේවා සපයයි. ඔහුට ඔහුගේ සේවාදායකයන් වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහ සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ නිළධාරින් සමඟ සාකච්ඡාවන් සඳහා සහභාගී වීමට සිදුවෙයි. මෙම දෙපාර්තමේන්තු දෙක සහ ඔහුගේ නිවස අතර, ගමන් වියදම් පිරිවැය, ඔහු විසින් ඔහුගේ ව්‍යාපාර ආදායමෙන් අඩුකර දක්වා තිබේ. නමුත්, සහකාර කොමසාරිස්වරයා විසින් මෙම වියදම සඳහා ඉඩදී නොතිබුණි.

**ඔබ විසින් කල යුතු දෑ:**

*"රාජපක්ෂ එදිරිව ආදායම් බදු කොමසාරිස්" (Rajapakse Vs CIT)* නඩු තීන්දුවේ තීරණය පදනම් කර ගනිමින් ඉහත වියදම **සොයිසාගේ** ව්‍යාපාර ආදායමෙන් අඩුකර ගතහැකිදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**පෙරේරා** ඉදිකිරීම් සමාගමක සේවය කරන වරලත් ඉංජිනේරුවෙකි. ඔහු, ඔහුගේ බදු උපදේශකවරයා වශයෙන් ඔබව තෝරාගෙන තිබේ. **පෙරේරාගේ** පහත සඳහන් ගනුදෙනු 2018/19 තක්සේරු වර්ෂයට අදාළ වේ:

(1) ඔහුට රු.234,000/- ක ලාභාංශ ආදායමක් ලැයිස්තුගත සමාගමකින් ලැබී තිබේ. ලාභාංශ ආදායම මත අඩුකල රඳවාගැනීමේ බද්ද [With Holding Tax (WHT)] රු.32,760/- ක් විය.

(2) වාණිජ බැංකුවක ඇති ස්ථාවර තැන්පතුවකින් රු.325,000/- ක පොලී ආදායමක් ඔහුට ලැබුණු අතර, අඩුකල රඳවාගැනීමේ බද්ද රු.16,250/- කි.

(3) වර්ෂය තුලදී ඔහු ලොතරැයි ත්‍යාගයක් ජයග්‍රහණය කල අතර, ඒ මත අඩුකල රඳවාගැනීමේ බද්ද රු.85,000/- කි.

(4) වර්ෂය තුලදී, ඔහු වෙනත් පෞද්ගලික සමාගමකට උපදේශන සේවා සපයන ලද අතර, එම උපදේශන ගාස්තුව මත අඩුකල රඳවා ගැනීමේ බද්ද රු.6,500/- ක් විය.

(5) හෝටලයකට කුලියට ලබාදුන් නිවසක් වෙනුවෙන් රු.1,200,000/- ක කුලී ආදායමක් ඔහුට ලැබුණු අතර, ඒ මත රු.120,000/- ක රඳවාගැනීමේ බදු අඩුකර තිබේ.

**ඔබ විසින් කල යුතු දෑ:**

ඉහත එක් එක් ගෙවීම අවසාන රඳවාගැනීමේ ගෙවීමක් (final withholding payment) ලෙස සැලකිය හැකිද නැද්ද යන්න **සඳහන් කරන්න**. (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**ප්‍රනාන්දු, සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** අළුතින් පත්කරන ලද ගණකාධිකාරිවරයා වේ. 2018/19 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ ඇස්තමේන්තුගත ආදායම් බදු වගකීම රු.900,000/- ක් වන අතර, සමාගම 2018/19 තක්සේරු වර්ෂය සඳහා පළමු කාර්තුමය ආදායම් බදු වාරික ගෙවීම වශයෙන් රු.300,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2018/19 තක්සේරු වර්ෂයේ දෙවන සහ තෙවන කාර්තුමය ආදායම් බදු වාරික ගෙවීම් සිදුකිරීමට නියමිත දින **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) දෙවන කාර්තුමය වාරික ගෙවීම වශයෙන් ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණය **ගණනය කරන්න**. (ලකුණු 03)

(c) පැහැර හරින ලද බදු අයකර ගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තිබෙන ක්‍රම (methods) තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**ජුපිටර් පොත්හල,** ලාභ/ලාභ සම සමව බෙදාගනිමින් **නාමල්** සහ ඔහුගේ වැඩිමල් සහෝදරයා වන **කමල්** විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයකි.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට අනුව හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.3,230,000/- ක් විය.

(1) ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩුකරගෙන තිබේ:

| | **රු.** |
|---|---|
| හවුල්කරුවන්ට ගෙවූ වැටුප් | 2,040,000 |
| ක්ෂය වීම් | 240,000 |

(2) **නාමල්** සහ **කමල්** ඔවුන් ව්‍යාපාරයේ නියැලීම වෙනුවෙන් පිළිවෙලින් මාසයකට රු.90,000/- ක් සහ රු.80,000/- ක් බැගින් වැටුප් ලබාගෙන තිබේ.

(3) 2018/19 තක්සේරු වර්ෂයේ ආදායම් බදු අරමුණු සඳහා වත්කම් මත ප්‍රාග්ධන දීමනාව රු.360,000/- කි.

(4) හවුල් ව්‍යාපාර ගොඩනැගිල්ලේ කොටසක් අවන්හලකට කුලියට ලබාදී ඇති අතර, කුලී ආදායම වශයෙන් රු.480,000/- ක් ලැබී තිබේ. මෙම මුදල ඉහත ශුද්ධ ලාභය ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන තිබේ. කුලියට ගත් පුද්ගලයා විසින් රඳවාගැනීමේ බදු අඩුකර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සඳහා, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) බදු අරමුණු සඳහා හවුල් ව්‍යාපාර ආදායම. (ලකුණු 03)

(b) හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු රඳවා ගැනීමේ බද්ද. (ලකුණු 02)

(c) එක් එක් හවුල්කරුගේ හවුල් ව්‍යාපාර ආදායම් කොටස. (ලකුණු 03)

(d) එක් එක් හවුල්කරුට හිමි රඳවා ගැනීමේ බදු බැර කොටස. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත තේවර් ලවර්ස් (පෞද්ගලික) සමාගම,** එකතුකළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි වූ සමාගමක් වන අතර, සමාගම, හිස්වැසුම්, අත්බෑග් වැනි දෑ නිෂ්පාදනය කරයි. ඔවුන්ගේ පාරිභෝගිකයන් ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශයන්හි ද වේ.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා, පහත සඳහන් තොරතුරු සමාගමේ පොත්වලින් උපුටා ගන්නා ලදී:

(1) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී විකුණුම් පිළිබඳ විස්තර පහත දැක්වේ:

| | |
|---|---|
| අපනයන [ඇමරිකානු ඩොලර් (US Dollar) 1 = රු.180/-] | ඇමරිකානු ඩොලර් 34,000 |
| VAT සඳහා ලියාපදිංචි පුද්ගලයන්ට දේශීය විකුණුම් (VAT රහිතව) | රු.4,425,000/- |

(2) කාර්තුව තුළදී සමාගම පහත සඳහන් යෙදවුම් බදු ගෙවා තිබේ:

| | **රු.** |
|---|---|
| අපනයන සඳහා පමණක් භාවිත කරන ආනයනික ඇසුරුම් ද්‍රව්‍ය මත | 116,000 |
| කාර්යාල වියදම් මත | 38,000 |
| නිෂ්පාදනයට භාවිත කරන යන්ත්‍රයක අළුත්වැඩියා මත | 4,800 |
| කළමනාකරණ අධ්‍යක්ෂ විසින් භාවිත කරන මෝටර් රථයේ අළුත්වැඩියා මත | 3,000 |

(3) සමාගම කාර්තුව තුළදී පැරණි යන්ත්‍රයක් රු.46,000/- කට විකුණන ලදී.

(4) පෙර කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද අතිරික්ත යෙදවුම් බද්ද රු.26,000/- කි.

(5) මාසික එකතු කළ අගය මත බදු වාරික වශයෙන් සමාගම රු.250,000/- ක් ගෙවා තිබේ.

*(එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය 15% ලෙස සලකන්න.)*

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතුකළ අගය මත බද්ද (VAT) **තක්සේරු කරන්න**. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සමාගමක් වන **සීමාසහිත හැෂ් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගම,** නිමි ඇඳුම් (ready-made) ආනයනය කර ඒවා තොග වෙළෙඳපොළේ විකිණීමේ නිරතව සිටියි.

පහත සඳහන් තොරතුරු 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත හැෂ් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගන්නා ලදී:

(1) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සියලු වියදම් අඩුකිරීමෙන් හා සියලු ආදායම් බැර කිරීමෙන් පසු බදු පෙර ශුද්ධ ලාභය රු.64,240,000/- ක් විය. 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මුළු පිරිවැටුම රු.526,200,000/- ක් විය.

(2) වෙනත් ආදායම් විස්තර පහත දැක්වේ:

| | **රු.** |
|---|---|
| ඉඩම මත කුලී ආදායම (දළ) | 600,000 |
| ගෘහ භාණ්ඩ විකිණීමෙන් ලද ලාභය | 80,000 |
| | **680,000** |

(3) 2019 මාර්තු 31 දිනට දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය පහත දැක්වේ:

| විස්තරය | පිරිවැය (රු.) | අත්පත් කරගත් වර්ෂය |
|---|---|---|
| ගොඩනැගිලි | 8,000,000 | 2015/16 |
| ප්‍රධාන විධායක නිලධාරියා පාවිච්චි කරන මෝටර් රථය | 2,680,000 | 2017/18 |
| ලොරි රථ | 4,324,000 | 2016/17 |
| කාර්යාල උපකරණ | 1,235,000 | 2018/19 |
| පරිගණක | 2,875,000 | 2017/18 |
| ගෘහ භාණ්ඩ | 1,859,000 | 2016/17 |
| පරිගණක මෘදුකාංග | 1,000,000 | 2018/19 |

- පරිගණක මෘදුකාංග වර්ෂය තුළදී සමාගම විසින් ආනයනය කරන ලදී.
- 2016/17 තක්සේරු වර්ෂයේදී රු.235,000/- ක පිරිවැයකට මිලට ගත් ගෘහ භාණ්ඩ 2018 දෙසැම්බර් මාසයේදී රු.142,500/- කට විකුණන ලදී. නමුත් මෙම ඉවත්කිරීමට අදාල පිරිවැය ඉහත දී ඇති ශේෂයේ ගලපා නොමැත.

(4) ආයෝජන දේපළ:

සමාගම විසින් 2015/16 තක්සේරු වර්ෂයේදී රු. මිලියන 10 කට ඉඩමක් අත්පත් කරගන්නා ලදී. මෙම ඉඩම 2018 අප්‍රේල් 01 දින සිට මාසයකට රු.50,000/- බැගින් සමාගමකට කුලියට දී තිබේ.

(5) පරිපාලන වියදම් තුළ පහත සඳහන් ඒවා ඇතුළත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය අයකිරීම රු.4,546,000/- කි.
- රෝගී සහ අසරණ අයට ආයතනික සත්කාර සැලසීම සඳහා පිහිටුවන ලද අනුමත පුණ්‍යායතනයකට සමාගම රු.1,000,000/- ක් පරිත්‍යාග කර තිබේ.
- තක්සේරු වර්ෂය තුළදී සැපයුම්කරුවන් මුණ ගැසීම සඳහා අලෙවි අධ්‍යක්ෂකවරයා චීනයට යවන ලද අතර, ඔහුගේ චාරිකාව සඳහා දරණ ලද පිරිවැය රු.653,000/- ක් වේ.
- කුලියට දෙන ලද ඉඩමේ අයිතිය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් රු.52,000/- ක නීති වියදමක් දරා තිබේ.
- 2018/19 තක්සේරු වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම රු.1,432,000/- කි.

(6) බෙදාහැරීමේ වියදම් තුළ පහත සඳහන් ඒවා ඇතුළත් වේ:

- සමාගමේ අනාගත ගැනුම්කරුවන්ට සංග්‍රහ කිරීම සඳහා රු.267,000/- ක මුදලක් වැයකර තිබේ.
- වෙළෙඳ ණයගැතියෙක් වෙනුවෙන් රු.143,500/- ක බොල්ණයක් සෘජුවම ආදායම් ප්‍රකාශනයට ලියාහැර තිබේ. ආදායම් ප්‍රකාශනයට සිදු කළ පොදු ප්‍රතිපාදනය රු.400,000/- ක් විය.

(7) පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

- වර්ෂය තුළදී, විශ්‍රාම ලැබූ සේවකයන්ට පාරිතෝෂික වශයෙන් රු.765,000/- ක් සමාගම ගෙවා තිබේ.
- පහත සඳහන් හිමිකම් නොපෑ ආර්ථික සේවා ගාස්තු [unclaimed Economic Service Charge (ESC)] ශේෂයන් සමාගමට තිබේ:

  2017/18 තක්සේරු වර්ෂය : රු.876,500/-

  2018/19 තක්සේරු වර්ෂය : රු.2,631,000/-

- 2018/19 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් සමාගම රු.5,000,000/- ක් ගෙවා තිබේ.
- ඉඩමේ කුලිකරුගෙන් රු.60,000/- ක රඳවාගැනීමේ බදු [Withholding Tax (WHT)] සහතික සමාගමට ලැබී තිබේ.
- 2017/18 තක්සේරු වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද අලාභය (බදු අරමුණු සඳහා ගලපන ලද) රු.3,200,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත හැෂ් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම,

(b) බදු අයකළ හැකි ආදායම,

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද.

***(සැ.යු:** යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.)* (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

වරලත් ගණකාධිකාරීවරයෙකු වන **රුවන් විජේසිංහ** ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවක ප්‍රධාන මූල්‍ය නිලධාරි වශයෙන් සේවය කරයි. ඔහු ප්‍රාථමික සේවා නියුක්ති ප්‍රකාශනය සමාගමට ලබා දී තිබේ.

2018/19 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා **රුවන් විජේසිංහගේ** ආදායම් සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) සේවා නියුක්තියෙන් ලැබූ ආදායම:

- දළ වැටුප - මාසයකට රු.200,000/- බැගින්.
- සමාගම ඔහුට රියැදුරෙකු සමඟ විදුලි මෝටර් කාරයක් (160 KW) ලබාදී තිබේ.
- මාසයකට රු.10,000/- ක් බැගින් වූ ඔහුගේ ජීවිත රක්ෂණ වාරික සේවායෝජක විසින් ගෙවනු ලැබේ.
- ඔහු අනිවාර්ය නිවාඩු ලබා තිබියදී පවුලේ අය සමඟ නුවරඑළියට ගියේය. **රුවන්** විසින් ගෙවන ලද රු.164,000/- ක හෝටල් බිල සේවායෝජක විසින් ප්‍රතිපූරණය කරන ලදී.
- සේවායෝජක විසින් අඩුකරන ලද උපයන විට ගෙවීම් මත බද්ද (PAYE) රු.192,440/- කි.

(2) වෘත්තීය විභාග සඳහා පන්ති පවත්වන ආයතනයක් **රුවන්ට** හිමිය. **රුවන්ගේ ආයතනයට** අදාලව 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ආදායම් සහ වියදම් ගිණුමේ සාරාංශය පහත පරිදි වේ:

| **වියදම්** | **රු.** | **ආදායම්** | **රු.** |
|---|---|---|---|
| කාර්ය මණ්ඩල වැටුප් | 875,000 | ආදායම් - පන්ති ගාස්තු | 3,876,000 |
| දේශකයන් සඳහා ගාස්තු | 1,565,000 | | |
| ජායා පිටපත් යන්ත්‍රය මත ක්ෂය වීම් | 65,000 | | |
| පරිත්‍යාග | 250,000 | | |
| විදුලි සහ ජල බිල්පත් | 223,000 | | |
| වෙනත් වියදම් | 234,000 | | |
| ශුද්ධ ලාභය | 664,000 | | |
| | **3,876,000** | | **3,876,000** |

- වර්ෂය තුළදී රු.260,000/- කට ජායා පිටපත් යන්ත්‍රයක් මිලට ගන්නා ලදී. ප්‍රාග්ධන දීමනා සඳහා හිමිකම් පෑ හැකි වෙනත් කිසිදු සුදුසුකම්ලත් වත්කම් නොතිබුණි.
- සාමාන්‍ය පෙළ සිසුන්ගේ ගණිත කුසලතා වර්ධනය කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට රු.250,000/- ක පරිත්‍යාගයක් සිදුකර තිබේ.
- අනෙකුත් සියලුම වියදම් බදු සඳහා ඉඩදෙන වියදම් වේ.

(3) **රුවන්** ඔහුගේ කාර්යාලයට ආසන්න කුලී නිවසක වාසය කරයි. ගාල්ලේ තිබෙන ඔහුට අයත් නිවස රු.45,000/- බැගින් වූ දළ මාසික කුලියකට සමාගමකට කුලියට දී තිබේ. මෙම නිවසේ වරිපනම් තක්සේරුව රු.280,000/- ක් වන අතර, 30% බැගින් වරිපනම් **රුවන්** විසින් ගෙවා තිබේ. කුලී ආදායමෙන් රු.54,000/- ක රඳවා ගැනීමේ බදු අඩුකර තිබේ.

(4) **රුවන්** ආයෝජන කීපයක් සිදුකර තිබෙන අතර, වර්ෂය තුළදී පහත සඳහන් පොලී ආදායම් ලැබී තිබේ:

- භාණ්ඩාගාර බිල්පත්වලින් : රු.126,000/-.
- ස්ථාවර තැන්පතුවකින් : රු.47,500/-. *(5% බැගින් රඳවාගැනීමේ බදු අඩුකිරීමෙන් පසු)*

(5) **රුවන්ට** හිමි ඉඩමක් හෝමාගම තිබෙන අතර, එය 2017 ඔක්තෝම්බර් 01 දින රු. මිලියන 50 ක පිරිවැයකට මිලදී ගන්නා ලදී. ඔහු මෙම ඉඩම 2019 මාර්තු මාසයේදී රු. මිලියන 55 කට විකුණන ලද අතර, ඉඩම වෙනුවෙන් ඔහු විසින් පහත සඳහන් වියදම් දරා තිබේ:

- 2018 ජනවාරි මාසයේදී, ඉඩම වටා වැටක් ඉදිකිරීම සඳහා රු.825,000/-.
- රු.100,000/- ක තැරව්කරු ගාස්තු.

(6) වර්ෂය තුළදී, **රුවන්** කාර්තුමය ආදායම් බදු වාරික ගෙවීම් වශයෙන් රු.500,000/- ක් ගෙවා තිබේ.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සඳහා **රුවන්ගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද, සහ,

(d) බදු නිදහස් ආදායම (වේ නම්). (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |